**මදුරාවල ප්‍රාදේශීය සභාව**

**-------------------------------**

**කළුතර දිස්ත්‍රික්කය**

**---------------**

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුලි 30 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මදුරාවල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ රු.27,600 කට මිලදී ගත් තණකොළ කපන මැෂින් දෙකක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව |

(ආ) නොසැසඳුණු ගිණුම්

-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දිමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.55,926,179 ක් වූ ගිණුම් විෂයයන් 04 කට අදාළ ශේෂයන් හා ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.28,231,177 ක වෙනසක් විය. | අදාල ශේෂ වල වෙනස් කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

(ඈ) විගණනය සඳහා අවශ්‍යා ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛන , ජල බදු ලේඛන , මුද්දර ගාස්තු ලේඛන, උසාවි දඩ ලේඛන නොමැතිවීම නිසා එකතුව රු.366,874,480 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතුවේ. | මේ වන විට ලේඛන යාවත්කාලීන කර ඇත. |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ<br>(i) 134(1) වගන්තිය | | දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රාදේශීය සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ ඇතුළත පිහිටියා වූ යම් නිශ්වල දේපලවල වරිපනම් බදු සඳහා නව හඳුනාගැනීමක් සිදු කර නොතිබුණි. | ප්‍රාදේශිය සභා පනත අනුව කටයුතු කල යුතුය. | වරිපනම් කලාපය තුල අළුතින් ඉදි කරන ලද ගොඩනැගිලි නව හඳුනා ගැනීම් ලෙස හඳුනා ගෙන තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව දක්වා ඇත. |
| | (ii) 160 වගන්තිය | 254,215 | හිඟ වරිපනම් බදු අය කර ගැනීමේ අවසන් පියවර ලෙසට දේපළ තහනම් කිරීම් කර නොතිබුණි. | ප්‍රාදේශිය සභා පනත අනුව කටයුතු කල යුතුය. | හිඟ වරිපනම් බදු අය කර ගැනිමටත් තව දුරටත් හිඟ වරිපනම් සඳහා දේපල තහනම් කිරිමට කටයුතු කරමි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | 170,780,122 | සභාව සතු සියලු ඉඩම් ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් | සභාව සතු සියලු ඉඩම් ගොඩනැගිලි සෑම | සභාව සතු සියලු ඉඩම් ගොඩනැගිලි නිවැරදිව හඳුනා |

| | | | | |
|---|---|---|---|---|
| | | හෝ පරීක්ෂා කිරීමකට ලක් කර නොතිබුණි. | වර්ෂයකටම වරක් හෝ පරීක්ෂා කල යුතුය. | ගැනිමට කටයුතු කරමි. |
| (ඇ) | 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | වරිපනම් වලට යටත් වන , දේපළ වසර 05 කට වරක් තක්සේරු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. | වරිපනම් ප්‍රතිශෝධනය කිරීම තක්සේරු දෙපාර්තමේන්තුව මගින් කටයුතු සිදු කරමින් පවතින බව දන්වා ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,907,882ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,262,899ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,590,602 | 1,731,072 | 1,251,401 | 479,671 | 1,322,992 | 1,408,443 | 1,084,556 | 524,229 |
| (ii) | බලපත්‍ර ගාස්තු | 358,350 | 358,250 | 358,250 | - | 333,500 | 245,450 | 356,741 | - |
| (iii) | වෙනත් ආදායම් | 19,582,850 | 8,800,000 | 13,979,541 | 25,089,403 | 14,635,930 | 10,500,000 | 9,163,990 | 22,852,583 |
| | | 21,531,802 | 10,889,322 | 15,589,192 | 25,569,074 | 16,292,422 | 12,153,893 | 10,605,287 | 23,376,812 |

2.2.2 ආදායම් රැස් කිරිමේ කාර්ය සාධනය

-----------------------------------------

වරිපනම් හා බදු

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වරිපනම් බදු කාල විශ්ලේෂණය අනුව වසර 05 කට වඩා පැරණි වරිපනම් බදු හිඟය රු.79,059 වු අතර, වසර 03-05 ත් අතර හිඟය රු.27,842 ක් විය. | හිඟ වරිපනම් ආදායම අයකර ගත යුතුය. | හිඟ වරිපනම් බදු ආදායම් එකතු කර ගැනීමට කටයුතු කරමි. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු ශේෂය රු.23,292,403 ක් හා උසාවි දඩ 1,797,000 ක් විය. | හිඟ ආදායම් අය කර ගත යුතුය. | හිඟ ආදායම් අය කිරිමට අවශ්‍ය කටයුතු කරමි. |

3 මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්ය සාධනය

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අතුරු ව්‍යවස්ථා<br>------------------<br>ප්‍රාදේශිය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 16 ක් ඉටු කිරිම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් සභාව විසින් ප්‍රධාන කාරණා 12 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුය. | පැහැදිලි කිරිම් කර නැත. |
| (ආ) ක්‍රියාකාරි සැලැස්ම<br>---------------------<br>2019 වර්ෂය තුළ සකස් කරන ලද ක්‍රියාකාරි සැලැස්ම තුල ක්‍රියාකාරකම් වල ප්‍රගතිය මැන බැලීමේ ක්‍රමවේදයක් නොතිබුණි. | පිළියෙල කරන ලද ක්‍රියාකාරි සැලැස්ම අනුව ක්‍රියාකාරකම් සිදු කලයුතු අතර එම ක්‍රියාකාරකම් වල ප්‍රගතිය මැන බැලිය යුතුය. | ඉදිරියේදි නිවැරදිව කටයුතු කරමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| | | |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව සිටියත්,එම අරමුණු සඳහා නව ගෝලීය දර්ශක තුලින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා 2019 දෙසැම්බර් 31 දිනට දිගු කාලීන සැලසුම් සකස් කර නිශ්චිතව වගකීම් පවරා නොතිබුණු අතර 2019 වර්ෂයේ අයවැය මගින් ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. | ඉදිරියේදී කටයුතු කරමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 වර්ෂයේදී කැබ් රථයට සිදු වූ රිය අනතුරට අදාලව යාන්ත්‍රික ඉංජිනේරුවරයා විසින් තක්සේරු කරන ලද මූල්‍ය හානිය රු.1,134,037 ක් වගකිව යුතු අයගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මූල්‍ය හානියට වගකිව යුතු අයගෙන් අය කල යුතුය. | පළාත් පාලන කොමසාරිස්ගෙන් උපදෙස් ඉල්ලා ඇති අතර උපදෙස් ලැබුණු පසු ඉදිරි කටයුතු කරමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) ආයුර්වේද වෛද්‍යවරයෙකුගේ පුරප්පාඩුවක් පැවතුණි. | පුරප්පාඩුව සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කල යුතුය. | පුරප්පාඩු වූ ආයුර්වේද වෛද්‍ය නිලධාරියා සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වා යවා ඇත. |
| (ii) සභාවේ පුස්තකාලයාධිපති තනතුරු 02 ක්, පෙර පාසැල් ගුරු තනතුරක්, සෞඛ්‍ය පරිපාලක එක් තනතුරක්, ආදාහනාගාර ක්‍රියාකරු තනතුරක් හා කාර්යාල කාර්ය සහායක තනතුරු 04 ක් පුරප්පාඩු වී පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කිරිමට කටයුතු කල යුතුය. | පුස්තකාලයාධිපති තනතුරු 02 න් එක් තනතුරක පුරප්පාඩු පිරවීමට පළාත් පාලන කොමසාරිස් දැනුවත් කර ඇත. |

(ආ) සේවක ණය

--------------

| | | |
|---|---|---|
| විශ්‍රාම ගිය හා ස්ථාන මාරු වී ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් රු.85,750 ක ණය ශේෂයක් වසර 05 ක සිට අයකර ගෙන නොතිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගත යුතුය. | අයකර ගැනීමට කටයුතු කරමි. |

3.4 වත්කම් කළමණාකරණය

----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ සුසාන භූමි 22 ක් පවතින බව හඳුනාගෙන තිබුණත් එම සුසාන භූමි සභාව වෙත පවරා ගැනීමට කටයුතු සිදු කර නොතිබුණි. | සභාවට අයත් සියළුම සුසාන භූමි පවරා ගැනීමට කටයුතු කල යුතු වේ. | සුසාන භූමි 12 ක් පවරා ගැනීමට කටයුතු කරමින් පවති. |